# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන)

**2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මුදල් අමාත්‍යතුමා විසින් 2021 දෙසැම්බර් මස 10 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2021 නොවැම්බර් මස 22 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[98 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් 2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, වැඩිපුර ගෙවන ලද හෝ වැරදි ලෙස ගෙවන ලද යම් මුද්දර ගාස්තුවක් ආපසු ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

**පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන)**

එල්.ඩී.—ඕ. 33/2021

## 2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

**1.** මේ පනත 2021 අංක    දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2011 අංක 13 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** 2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) 2 වන වගන්තිය එම වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) එම වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ “අදාළ පළාත් සභා වෙත මාරු කරනු ලැබිය යුතු ය.” යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්:—

“අදාළ පළාත් සභා වෙත මාරු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් තැනැත්තකු විසින්,

(අ) නිසි ලෙස ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ඉක්මවා මුද්දර ගාස්තු ගෙවා ඇති බවට; හෝ

(ආ) එම මුද්දර ගාස්තු අදාළ වන සාධන පත්‍රයක් මත වැරදි සහගත ලෙස මුද්දර ගාස්තු ගෙවා ඇති බව සහ 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ එවැනි මුද්දර ගාස්තුවක් ගෙවීමට ඔහු බැඳී නොසිටින බවට,

කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි, ලිඛිතව සිදු කරනු ලබන ඉල්ලීමකින් ඔප්පු කරනු ලබන එම තැනැත්තා වෙත, පළාත් සභා වෙත මාරු කරනු ලැබීමට පෙරාතුව වූ යම් කාලසීමාවක් තුළ දී මුද්දර ගාස්තු වශයෙන් එකතු කරන ලද මුදලින්, එසේ ගෙවන ලද මුදල ආපසු ගෙවනු ලැබිය යුතු ය.”; සහ

(3) නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:—

“(2) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 11 වන වගන්තියේ විධිවිධාන, මේ වගන්තිය යටතේ ආපසු ගෙවීම සඳහා වූ සියලු ඉල්ලීම් සඳහා අදාළ වන්නේ ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා “කොමසාරිස් ජනරාල්වරයා” යන්නට 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ ඒ සඳහා ඇති අර්ථයම තිබිය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.